පුරවැසි අධ්‍යාපනය 9 ශ්‍රේණිය

මාතෘකාව අංක 03 ප්‍රජාතන්ත්‍රවාදි පාලනය

නිපුනතාව ප්‍රජාතන්ත්‍රවාදි ජන සමාජයක යහපත් පුරවැසියකු ලෙස කටයුතු කරයි

ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්ද ?

ප්‍රජාතන්ත්‍රවාදය යන්න සරලව මෙසේ අර්ථ දැක්විය හැකිය

ප්‍රජාව යනු ජනතාවයි එනම් රටක ජිවත්වන පුරවැසියන්ය

තන්ත්‍රය යනු පාලන ක්‍රමයයි එනම් සමාජය මෙහෙය වන පාලන රටාවයි

ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදය යනු ජනතාන විසින් ජනතාව උදෙසා ගෙනයනු ලබන ජනතාවගේ පාලන ක්‍රමයකි

මෙහි දි ජනතාව පාලනය සදහා සහභාගි සම්බන්ධ වේ

ප්‍රජාතන්ත්‍රවාදි පාලනය පිළිබදව විවිධ අර්ථ නිරූපන දක්නට ඇත

මෙහිදි ඇමෙරිකානු හිටපු ජනාධිපතිවරයකු වූ ඒබ්‍රහම් ලින්කන් ගේ අර්ථ නිරූපනය ජනප්‍රිය හා පැහැදිලි එකකි

- එනම් ජනතාව විසින් ජනතාව උදෙසා ගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමයක් ලෙයසි

- ජේ ආර් ලවල් විසින් ඉදිරිපත් කර ඇති අර්ථ දැක්විම

  - සියලූම දෙනාට අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයක් ලෙස හදුන්වයි

එවැනි පාලන ක්‍රමයන් පවතින රාජ්‍ය ලෝකයේ විශාල ලෙස දක්කට ලැබේ

උදාහරණ ලෙස ශ්‍රී ලංකාව ඉංදියාව පාකිස්ථානය ජපානය ඇමෙරිකාව නවසිලන්තය ආදි වශයෙන්

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයට අමතරව ලෝකයේ විවිධ රටවල වෙනත් පාලන ක්‍රමයන්ද දක්කට ලැබේ

- උදාහරණ ලෙස රාජාණ්ඩු පාලන ක්‍රම ඒකාධිපති පාලන ක්‍රම හමුදා පාලන ක්‍රම ආදී ලෙස

ප්‍රාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක වෙනත් පාලන ක්‍රම වලට වඩා වෙනස් වූ මූලික ලක්ෂණ රාශියක් පවතී

එසේ පවතින වැදගත් ලක්ෂණයන් ලෙස පහත සඳහන් ඒවා සහහන් කළ හැකිය

- 1 සර්වජන ඡන්ද බලය

රාජ්‍ය පාලනය සඳහා නියෝජිතයන් තෝරා පත් කර ගැනීම ජනතාවගේ කැමත්ත අනුව සිදුකරයි එහිදී නිසි වයස සම්පූර්ණ වූ සියලු පුරවැසියන්ට තම කැමත්ත අනුව නියෝජිතයන් පත්කර ගත හැකිය මැතිවරණයකදී තම කැමත්ත ප්‍රකාශ කිරීමේ අයිතිය සර්ව ජන්දබල අයිතිවාසිකම ලෙප සැලකේ

- 2 නිදහස් සාධාරණ මැතිවරණ පැවත්වීම

රාජ්‍ය පාලනය සඳහා තම නියෝජිතයන් පත් කර ගැනීමේදී ප්‍රජාතන්ත්‍ර පාලන ක්‍රයක දී සිදුකරන්නේ මැතිවරණ මගින්ය

එවැනි මැතිවරණ පැවත්වීම සිදුකරද්දී එම මැතිවරණ ස්වාධීනව හා සාධාරණ ලෙස පැවත්විය යුතුය

පුරවැසියාට ජන්දය පාවිච්චි කිරීමේදී කිසියම් පුද්ගලයකු ගේ හෝ කිසියම් ආයතනයක බලපෑම් වලින් තොරව ජන්දය භාවිතා කිරීමට අයිතිය තිබිය යුතුය

නියමිත කාලයට නියමිත ආකාරයෙන් සාධරණව මැතිවරණ පැවත්විය යුතුය

යන අදහස මෙයින් පැහැදිලි කරයි

- 3 රට ජන්ද කොට්ඨාශ වලට බෙදීම

රටේ සෑම ප්‍රදේශයක්ම නියෝජනය වන ආකාරයෙන් ජන්ද ප්‍රදේශ බෙදා වෙන්කර දක්වයි මේ සඳහා මැතිවරණ කොට්ඨාශ සීමා නිර්ණ කොමිසම ක්‍රියා කරයි

උදාහරණ ලෙස ශ්‍රී ලංකාවේ මැතිවරණකොට්ඨාශ 160 කට බෙදා දක්වා ඇත

- 4 තරගකාරි දේශපාලන පක්ෂ ක්‍රමයක් දක්නට ලැබිම

ප්‍රජාතන්ත්‍රවාදි පාලන ක්‍රමයක් විවිධ දේශපාලන මත දැරිමට අයිතියක් ජනතාවට ඇත ඒ අනුව තමන් කැමති දේශපාලන මත අනුව දේශපාලන පක්ෂ පිහිටුවා ගැනිමට හා ඒවාට බැදිමට අයිතිය ඇත

ඒ අනුව ලංකාවේ විවිධ දේශපාලන පක්ෂ රාශියක් පිහිටුවා ගෙන ඇත

- උදාහරණ ශ්‍රි ලංකා නිදහස් පක්ෂය එක්සත් ජාතික පක්ෂය ජනතා විමුත්ති පෙරමුන පොදු ජන පෙරමුන ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුන
- දවිඩ ජාතික සංවිධනය මුස්ලිම් කොන්ග්‍රස් පක්ෂය
-
-
- 5 මහජන ජන්දයෙන් ආණ්ඩු හා පාලකයන් පත් කර ගැනිම

ප්‍රජාතන්ත ුරටක රාජ්‍ය පාලනය සදහා ආණ්ඩු පත් කරනු ලබන්නෙත් රාජ්‍ය පාලකයන්පත් කර ගනු බලන්නේ රටේ ජනතාව විසින්ය කලින් කලට පවත්වනු ලබන මැතිවරණ මගින් පාලන නියෝජිතයන් ජනතාව තෝරා ගනු ලබයි

- 6 බහුතර කැමත්ත මත තිරණ ගැනිම

තමවැනි පාලන ක්‍රමයක වැඩි දෙනෙක් නැතහොත් හුතර පිරිසක ගේ කැමත්ත මත තිරණ ගනු ලබයි එකාධිපති ක්‍රම වැනි පාලන ක්‍රමයක එක් පුද්ගයකු ගේ කැමත්ත මත කටයුතු කරනු ලබයි

- 7 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවකට අනුව රට පාලනය කිරිම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු රටක පාලනය සිදුවිය යුත්තේ කෙසේ ද යන්නත් එහි පාලන ආයතන ෂතු බලතලකවරේද යන්නත් පාලකයන් ගේ බලතල හා වගකිමත් පුරවැසියා ෂතු වගකිම් හා යුතුකම් පිලිබදව දක්වන නිතිඍනුකූ ලියවිල්ල වේ

- 8 නීතියේ ආධිපත්‍ය පැවතිම

නීතියේ ආධිපත්‍ය යනු රටේ සෑම පඅරවැසියකුටම නීතිය සමානව ක්‍රියාතමක කිරීමයි මෙහි දී ජාතිය ආගම භාෂාව ස්ත්‍රී පුරුෂ උගත් නුගත් ආදි වශයෙන් කිසිදු භේහයකින් තොරව නිතිය පොදු විය යුතුය යන්නයි

- 9 අධිකරණයේ ස්වාධීනතවය පැවතිම

ප්‍රජාතන්ත්‍රවාදි පාලනය තුළ දැකිය හැකි වැදගත් ලක්ෂණයක් නම් අධිකරණයේ ස්වාධීනතවය දැක්වේ මෙයින් අදහස් කරන්නේ කිසිදු බලපෑමකින් හෝ භේදයකින් තොරව සියල්ලම නිතිය ඉදිරියේ සමාන බවයි

## ප්‍රජාතන්ත්‍රපාලන ක්‍රමයක් සාර්ථකමට බලපාන සාධක

ප්‍රජාතන්ත්‍ර පාලන ක්‍රමය ක් සාර්ථ විම සදහා අංග කිපයක් තිබිය යුතුවේ නැතහොත් එවැනි පාලන ක්‍රමයක් සාර්ථක නොවේ

ඒ අනුව නිදසුන් කිපයක් දක්විය හැකිය

1 දේශපාලන අවබෝධයක් තිබෙන ජනතාවක් සිටිම

2 කැපවිමෙන් යුතු නායකත්වය

3 ආර්ථික 'තත්වය සතුටදායක ලෙස පැවතිම ( දියුණු ආර්ථිකයක් පැවතිම )

4 නිදහස් ජනමාධ්‍යක් පැවතිම

5 නිතියේ ආධිපත්‍ය පැවතිම මේ අතර වැදගත් වේ (ඉහත විස්තර කර ඇත )

## ප්‍රජාතන්ත්‍රවාදි සමාජයක පුරවැසියකු සතු අයිතිවාසිකම් හා යුතුකම්

වෙනත් පාලන ක්‍රම පවතින සමාජයක මෙන් නොව ප්‍රජාතන්ත්‍ර වාදි සමාජයක පුරවැසියාට අයිතිවාසිම් රාශියක් හිමිවි ඇත

මෙම අයිතිවාසිකම් දේශපාලන අයිතිවාසිකම්

ආර්ථික අයිතිවාසිකම

සමාජිය අයිතිවාසිකම් ආදි ලෙස වර්ග කර ඇත

ඒ අනුව පුරවැසියා ට හිමිව ඇති අයිතිවාසිකම් කිපයක් පහත දැක්වේ

1 නමක් සහ ජාතියක් ලැබීමට ඇති අයිතිය ( උපත ලියාපදිංචි කිරීමේ දි නමක් ජාතියක් ලැබීමට අයිතිය ඇත )

2 ජිවත් විමට ඇති අයිතිය ( කිසිවකුට තව කෙනෙකුගේ ජිවිතය විනාශ කළ නොහැක

3 අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය ( ඉගෙන ගැනිමට ඇති අයිතිය )

4 කැමති ආගමක් ඇදහිමට ඇති අයිතිය

5¨රැකියාවක් කිරිමට ඇති අයිතිය

6 පාලකයන් තෝරා ගැනිමට ඇත අයිතිය

**අයිතිවාසිකම් භුක්ති විදිමේ දි ඉටුවිය යුතු යුතුකම්**

තමා විසින් සමාජයට ඉටුකළ යුතු¸දේවල්

**උදාහරණ**

1 ආණ්ඩු ක්‍රමව්‍යවස්ථාව හා නිතිය ආරක්ෂා කොට අනුගමනය කිරිම

2 ජාතික අභ්වෘද්ධිය වර්ධනය කොට ජාතික සමගිය පෝෂණය කිරීම

3 තමන් විසින් තෝරා ගනු ලබන රැකියාවෙහි හෘද සාක්ෂියට අනුව වැඩ කිරිම

4 පොදුදේපල සුරක්ෂිත කොට ආරක්ෂා කිරිම හා නාස්තිකිරිමෙන් වැළකිම

5 සෙසු අයගේ අයිතිවාසිකම් හා නත් වැදුරුම් නිදහස ගරු කිරිම

6 ස්වභාව ධර්මය සහ ස්වභාවික සම්පත් රැක ගැනිම

**මෙයට අමතර පුරවැසි යුතුකම් කිපයක් පවති**

1 දෙමාපියන්ට සැළකිම

2 නියමිත බදුමුදල් බිල්පත් ගෙවිම

3 පොලිසියට හා ආරක්ෂක සේවා සඳහා සහාය විම

ඉහත  මාතෘකාවට අදාල පාඩම කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න

1 ප්‍රජාතන්ත්‍ර සමාජයක් වූ ශ්‍රී ලංකාවේ පුරවැසියකු සතු අයිතිවාසිකම්
සඳහන් කර කරන්න

2  පුරවැසියන්  විසින්ඉටු කළයුතු යුතුකම් ලැයිස්තුවක් ලියන්න

3 දෙමව්පියන් ගෙන් දරුවන්ට ඉටවියු යුතුකම් 5 ක් ලියන්න

4 දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටු විය යුතු යුතුකම් 5 ක් ලියන්න

5 ගරුවරුන් ගෙන් දරුවන්ට ඉටු විය යුතු යුතුකම් 5 ක් ලියන්න

6 සේවා යෝජකයන් සේවකයන් වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් 5 ක් ලියන්න

7 සේවකයන් සේවා යෝජකයන් වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් 5 ක් ලියන්න